# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 නොවැම්බර් මස 04 වන අඟහරුවාදා

### බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම

පූ.භා. 09.45 ට සභාව රැස්විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරළගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

**ගරු මන්ත්‍රීවරු**

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්
උදාර රත්නායක
උදේන විජේරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී.අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මෙහොමඩ් ෆයිරූස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රවීන්ද්‍ර යසස් කුමානායක
රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වනිගරත්න
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සේනක දමයන්ත ද සිල්වා
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය
හෙක්ටර් බෙත්මගේ

**නොපැමිණීම :**

ගරු හර්ෂණ සුපුන් රාජකරුණා (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

**ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ආනන්ද රංජිත් රූපසිංහ
ඇ.ශ්‍රීනාත් ම. පෙරේරා
උපාලි ගුණරත්න
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
කවින්ද හේෂාන් ජයවර්ධන
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නිරෝෂන් පාදුක්ක
මනෝ ගනේෂන්
මහේෂ් අල්මේදා
රජිත හපුආරච්චිගේ
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලයනල් ජයසිංහ
විජිත් ප්‍රියන්ත

## 01. සභාපතිතුමාගේ නිවේදන :

*i*

*"2014 අගෝස්තු මස 19 වන දින සභා සම්මත වූ 2014 අංක 03 දරන බස්නාහිර පළාත් සුළු වාරිමාර්ග ප්‍රඥප්තියට සහ 2014 ඔක්තෝබර් මස 21 වන දින සභා සම්මත වූ පරිපූරක ඇස්තමේන්තුව - 02, 2014 ට අදාළ 2014 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තියට ගරු ආණ්ඩුකාරතුමා විසින් පිළිවෙළින් 2014 ඔක්තෝබර් මස 21 සහ ඔක්තෝබර් මස 23 වන දින අනුඥාව ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*ii*

*"කාර්ය පටිපාටි රීති කාරක සභාවේ සාමාජිකත්වය දැරූ අර්ෂාඩ් නිසාම්ඩීන් ගරු මන්ත්‍රීතුමාගේ සහ මංජුල බුද්ධදාස ගරු මන්ත්‍රීතුමාගේ කාරක සභා සාමාජිකත්වය කාර්ය පටිපාටි රීති අංක 86 (4) ප්‍රකාරව අහෝසි වන අතර, 2014.10.31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී සාමාජික ධූරයන් සඳහා හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාව සහ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාව පත් කරන ලද බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iii*

*"2014.07.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යවර ප්‍රසන්න රණතුංග මැතිතුමාට අදාළ සෙසු අමාත්‍යාංශ විෂයයන්,[1] මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ වශයෙන් විය බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

*iv*

*"මීළඟ සභා රැස්වීම පැවැත්වීමට නියමිත 2014.11.18 දින ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් 2015 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා එම විසර්ජන ප්‍රඥප්තිය මෙම සභාවට ඉදිරිපත් කිරීමට නියමිත බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී."*

## 02. කාරක සභා වාර්තා :

ගරු සභාපතිතුමා විසින් පහත සඳහන් කාරක සභා වාර්තා පිළිගන්වන ලදී.

i. 2014.09.24 වන දින පැවැති පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.
ii. 2014.10.23 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***පූ.භා. 10.29 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.22 ට යළිත් රැස් විය.***

## 03. රීති අංක 107 යටතේ යෝජනාව :

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලදුව සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.

*"කාර්ය පටිපාටි රීති 107 මගින් සලසා ඇති ප්‍රතිපාදනවලට අනුව පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සඳහා කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීති අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

[1] 2014.11.04 දින නිල වාර්තාවේ 01පිටුව බලන්න.

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසවලින් විපතට පත් වූවන්ට සහන සැලසීමට කඩිනම් වැඩ පිළිවෙළක් සැකසීම

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී.

*"ස්වභාවික උවදුරු හා කාලගුණික විපර්යාසයන්වලට සමස්ත ලෝකයම ගොදුරු වෙමින් පවතින බව අප කවුරුත් පිළිගන්නා සත්‍යයකි. එබැවින් බස්නාහිර පළාත් සභාව ලෙස මෙවැනි උවදුරු පැමිණි විට ඒ සඳහා මුහුණ දීමට හා එය වළක්වා ගැනීමට වෙනම ඒකකයක් පිහිටුවීම ඉතා කඩිනමින් කළ යුතු කාර්යයක් බවට පත්ව ඇත. ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශයද ඒකාබද්ධව කඩිනමින් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම ගරු සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***පූ.භා. 11.55 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***

***ප.භා. 01.05 ට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා [හෙක්ටර් බෙත්මගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

***ප.භා. 01.35 ට, සභාවේ ගණපූරණය නොමැති බව එස්.එම්. මරික්කාර් ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදින්, කැඳවීම් සීනුව නාද කරන ලදුව පසුව, ගණපූරණය ඇති විය.***

***අනතුරුව ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. සභාව කල් තබන අවස්ථාවේ අසන ප්‍රශ්න :

***ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට පිළිතුරු[2] ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා [රංජිත් සෝමවංශ ගරු අමාත්‍යතුමා වෙනුවෙන් ] විසින් සභාගත කරන ලදී.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් සති දෙකක කාලයක් කල් ගන්නා ලදින්, ඊළඟ න්‍යාය පත්‍රයට යොමු කරන ලදී.***

## 06. සභාව කල් තබන අවස්ථාවේ කළ යෝජනාව :

*මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 31 (ආ) යටතේ, ඉදිරිපත් කරන ලද රාජ්‍ය බලය යොදා ගනිමින් බලහත්කාරයෙන් ශ්‍රී ලංකා නිදහස් ගුරු සංගමයට සාමාජිකයන් බඳවා ගැනීම සම්බන්ධ යෝජනාව[3] සාකච්ඡාවට ගන්නා ලදී.*

***ප.භා.02.23 ට යෝජනාව සාකච්ඡා කොට අවසන් කරන ලදී.***

[2] 2014.11.04 වන දින නිල වාර්තාවේ පිටු අංක 78 බලන්න.
[3] 2014.11.04 වන දින නිල වාර්තාවේ පිටු අංක 80 සිට 89 දක්වා බලන්න.

## 07. **කල් තැබීම :**

අනතුරුව, ගරු සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව, පළාත් සභාව අ.භා. 02.24 ට, 2014 නොවැම්බර් මස 18 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.11.05
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පූර්/05
Minuts 2014.11.05 - Hansard Section